# ගෘහස්ථ කම්කරු සංගමයේ ව්‍යවස්ථා මාලාව

# ගෘහස්ථ කම්කරු සංගමයේ ව්‍යවස්ථා මාලාව

01. **සමිතියේ නම ෘ-** මෙම සමිතියේ නම ගෘහස්ථ කම්කරු සංගමය යනු වේ. මින් පසු මෙහි එය සමිතිය යනුවෙන් අදහස් කරනු ලැබේ.

02. **ලියාපදිංචි කළ කාර්යාලය ෘ-** මෙම සමිතිය පිළිබඳ ලියාපදිංචි කළ කාර්යාලය සහ සමිතියේ කටයුතු කරන ස්ථානය අංක. 443/1/1 විලියම් ගොපල්ලව මාවත, මහනුවර. යන තැන හෝ විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙන අන්කසි ස්ථානයක් වේ.

03. **පරමාර්ථයෝ ෘ-**

(අ) ශ්‍රී ලංකාව ඇතුලත ගෘහ ආශිත සේවයෙහි/විවිධ සේවයන්හි සේවයේ නියුක්ත සියළුම සේවකයින් සමිතිය යටතේ මැනැවින් සංවිධානය කිරීම

(ආ) ඒ සාමාජිකයින්ගේ ලාභ ප්‍රයෝජන, අයිතිවාසිකම් හා වරප්‍රසාද පිළිබඳ පරික්ෂාවෙන් සිටීම, ඒවා දියුණු කිරිම හා ආරක්ෂා කිරිම

(ඉ) සාමාජිකයින්ගේ ආර්ථික තත්වය නගා සිටුවීම

(ඊ) සාමාජිකයින්ට පහත සඳහන් ප්‍රයෝජනයන්ගෙන් එකක් හෝ සියල්ලම සලසාදීම

ෘස** වෘත්තිය අරගල වලදී සහ ඔවුනට එල්ලවන පලිගැනීම් ක්‍රියාවන්හිදී සහනය සහ ඔවුන්ගේ රැකියාව සම්බන්ධයෙන් වෙනත් එබඳුආධාරෝපකාර ලබාදීම

**හෝ**

ෘෂ** ඔවුන්ගේ රැකියාවන් සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවන්හිදී නීති ආධාර නීති උපදේශ

(උ) සමිතිය හා වෙනත් සමිති අතර ද, සමිතියේ සාමාජිකයින් හා ඔවුන්ගේ සේවය අතර ද සමිතියේ එක් එක් සාමාජිකයා හා අනෙක් සාමාජිකයින් අතර ද සම්බන්ධය අහමත් කිරීම

**සහ**

(ඌ) වෘත්තිය ආරවුල් වල දී සාමාජිකයින් වෙනුවෙන් පෙනී සිටීම

04. **සාමාජික නාමාවලිය** දිනෙන් දිනට නිවැරදි සාමාජිකයින්ගේ නාමාවලියන් පවත්වාගෙන යාම ගැන ලේකම්තැන වගකිව යුතු වේ.

05. **පොත්පත් පරීක්ෂණය** සමිතියේ සාමාජිකයින්ට ඕනෑම අවස්ථාවක සාමාජික නාමාවලිය හා ගණණ පොත් පරීක්ෂා කර බැලිය හැකිය.

සමිතියේ අරමුදල් කෙරෙහි සැලකිල්ලක් දක්වන ඕනෑම සාමාජිකයෙකුට සමිතියේ සාමජික නාමාවලිය හා ගණන් පොත් පරීක්ෂා කර බැලිමට වුවමනාවී ඒ බව දින 21 කට කලින් ලිපියකින් දැනුම් දි පැමිණි වට ඊට ඉඩ දිය යුතුය.

**06. වාර්ෂික මහා සභා රැස්විම :-**

(අ) සමිතියේ වාර්ෂික මහා සභා රැස්වීම මුදල් වර්ගයෙන් (එනම් අප්‍රේල් මස 01 වන දා සිට මාර්තු මස 31 වනදා වූ කාලයෙන්) පසුව හැකිතාක් ඉක්මනින් එහෙත් ජුනි මස 15 වැනිදායින් මෙපිට පැවැත්විය යුතුය. මේ රැස්වීම සඳහා අවශ්‍ය ගණපූරණනය සම්පූර්ණ සාමාජික සංඛ්‍යාවෙන් යටත් පිරිසෙන් තුනෙන් එකක් විය යුතුයි.

(ආ) වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීමට යටත් පිරිසෙයින් මසකට කලින් ඒ බව ලේකම්තැන විසින් සියලුම සාමාජිකයින්ට දැනුම් දිය යුතුය.

(ඉ) රැස්වීම පිළිබඳ නිවේදනයේ සිට සති 02 ක් ඇතුළත සාමාජිකයෝ තමන් විසින් ඉදිරිපත් කිරිමට අදහස් කරන ව්‍යවස්ථා සංශෝධන යෝජනා සහ නිළධාරීන් තෝරා පත්කර ගැනිමේ නාම යෝජනාවද ලේකම්තැන වෙත යැවිය යුතුය.

(ඊ) ලේකම්තැන විධායක මණ්ඩලය විමසා වාර්ෂික මහා සභා රැස්වීම සඳහා ඉහත (ඉ) වගන්තියේ සඳහන් යෝජනා ආදිය ඇතුළත් න්‍යාය පත්‍රයක් පිළියෙල කර එය වාර්ෂික මහ සභා රැස්විම පැවැත්විමට යටත් පිරිසෙයින් දාහතරකට :14* කලින් සාමාජිකයින්ට ලැබෙන්නට සැලැස්විය යුතුය.

**07. විශේෂ මහ සභා රැස්වීම**

සභාපති තැන විසින් ලිපියකින් ඉල්ලා සිටිමට හෝ විධායක මණ්ඩලයේ තීරණය පිට හෝ දින තිහක් :30* කල් දෙමින් සාමාජිකයින්ගෙන් ........................ කට නොඅඩු පිසක් අත්සන් කර ලේකම්තැන වෙත ඉදිරිපත් කළ ලියවිල්ලක් ඉල්ලුම්කළ විට හෝ විශේෂ මහා සභා රැස්විම් කැඳවිය යුතුය. ඉල්ලා සිටිම හෝ තීරණය හෝ ඉල්ලීම කළ දිනයේ සිට දින අනුවක් :90* ඇතුළත රැස්වීමේ අරමුණ ද දන්වා යවමින් ලේකම්තැන විශේෂ මහා සභා රැස්විම කැඳවිය යුතුය. එසේ දන්වා යැවු අරමුණ හැර වෙන කිසිවක් ඒ රැස්වීමේ දි සාකච්ඡා නොකළ යුතුය. කවර විහේෂ මහ සභා රැස්වීමකට වුවද අවශ්‍ය ගණපූරණය වාර්ෂික මහ සභා රැස්වීමකට අවශ්‍ය ගණපූරනයම වන්නේය.

**08. විධායක මාණ්ඩලික රැස්වීම**

අවශ්‍ය අවස්ථාවන්හි හෝ අඩු ගණනේ මසකට වරක් විධායක මණ්ඩලය රැස්විය යුතුය. ගණපූරණයට විධායක මාණ්ඩලිකයේ හය දෙනෙක් විය යුත්තාහ.

**09. වාර්තා**

සෑම රැස්වීමකම වාර්තාවක් සටහන් කර ගැනීමත්, එය මීළඟ එවැනි රැස්වීමේදී කියවා සම්මත කර ගැනීමත් පිළිබඳව ලේකම්තැන වගකිව යුතු වේ.

10. **ඡන්ද විමසීම**

රැස්වීමට පැමිණි සාමාජිකයින්ගේ වැඩිදෙනාගේ ඉල්ලෑම පිට රහස් ඡනදය විමසිය යුතු වූ විට හැර අන් සෑම අවස්ථාවකදීම ඡන්දය දීම අත් එසවීමෙන් කළයුතු වන්නේය.

11. **සාමාජිකත්වය**

(අ) ■ ලංකාව තල සේවයේ නියුක්ත වයස අවුරුදු 16 ට වැඩි ස්ත්‍රී / පුරුෂ ඕනෑම කෙනෙක් සමිතියේ සාමාජිකත්වය ලැබීමට සුදුසුසන් වේ.

(ආ) සම්මාන හෝ තාවකාලික සාමාජිකයන් පත්කර ගත නොහැකිය

(ඉ) සාමාජිකත්වය ඉල්ලා සිටින සෑම කෙනෙක්ම විධායක මණ්ඩලයෙන් නියමිත ආකෘති පත්‍රයෙහි එම ඉල්ලිම කළ යුතුය. සාමාජිකත්වය සඳහා ඕනෑම කෙනෙකු කරන ඉල්ලිමක් හේතු නොදක්වා ප්‍රතික්ෂේප කිරීමේ බලය විධායක මණ්ඩලයට ඇත.

(ඊ) සමිතියේ ව්‍යවස්ථා කඩකළ බව ඔප්පු වූ කවර සාමාජිකයෙකු වුවද සාමාජිකත්වය තාවකාලික වශයෙන් තහනම් කිරිමට විධායක මණ්ඩලයට බලය ඇත්තේය. එහෙත් එසේ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය තාවකාලිකව තහනම් කළවිට ඒ ක්‍රියාව ස්ථිර කිරිම සඳහා හෝ ඒ පිළිබඳව වැඩිදුරටත් ක්‍රියාකිරීම සඳහා එම කරුණු ඊළග මහ සභා රැස්වීමට ඉදිරිපත් කළ යුතුය.

12. **කළයුතු ගෙවීම්**

(අ) සෑම සාමාජිකයෙකු විසින්ම මාස්පතා සිය දායක මුදල් වශයෙන් ....................ක් ගෙවිය යුතුය. මේ දායක මුදල් ප්‍රමාණය වාර්ෂික මහා සභා රැස්විමක දී හෝ විශේෂ මහ සභා රැස්විකදී හෝ වෙනස් කළ හැකි වේ.

(ආ) අවශ්‍ය වූ විට විශේෂ ආධාර ඉල්ලා සිටීමට විධායක මණ්ඩලයට බලය ඇත

(ඇ) සමිතියට ගෙවනු ලබන්නා වූ සෑම මුදලක්ම වෙනුවන් භාණ්ඩගාරික තැන කුවිත්නාසියක් නිකුත් කළ යුතු වන්නේය.

13. **දඬ ගැසීම හා අහිමි කිරීම**

(අ) සාමාජිකයින්ට දඩ ගසනු නොලැබේ.

(ආ) මෙම සමිතියේ ව්‍යවස්ථාව උල්ලංඝණය කරන්නා වූ ....................................... සියළුම සාමාජිකයින් ඒ හේතුවෙන් සාමාජිකත්වය අහිමි වන අතර, එතැන් පටන් ඔවුන්ට සමිතියෙන් සැලසෙන සියළුම අයිතිවාසිකම් හා වරප්‍රසාද අහිමි වන්නේය.

## 14. ව්‍යවස්ථා

මෙම ව්‍යවස්ථාවන් අඩු වැඩි කිරීම්, වෙනස් කිරීම් ආදී කවර ක්‍රමයිකන් හෝ සංශෝධනය කරන්නේ නම් එසේ කළ හැක්කේ සමිතියේ මහා සභා රැස්වීමකදී රැස්වීමට පැමිණ සිටින ඡන්ද බලය හිමි සාමාජිකයින්ගනේ තුනෙන් දෙකොටසකගෙන් අනුමත වූ යෝජනාවකින් පමණි. එහෙත් සමිතියේ නාමය වෙනස් කිරීමේදී, ඡන්ද විමසීමකින් හෝ තීරණය කර ගන්නා වූ අන් අයුරකින් කැමැත්ත ලබා ගත හැකිය.

## 15. විධායක මණ්ඩලය

(අ) විධායක මන්ඩලය, සභාපති, උප සභාපතිවරු ................................ ක් ප්‍රධාන ලේකම්/වරු සම ලේකම්වරු .................... ක්. උප ලෙක්මවරු ................ ක්, භාණ්ඩාගරිකවරු ........... ක්, යන මොවුන්ගනේද, තවත් විධායක සභිකයන් ............. දෙනෙකුන්ගෙන්ද සමන්විත විය යුතුය. මේ සියළු දෙනාම වාර්ෂික මහා සභා රැස්විමකදී, විධායක මණඩලයේ සම්පූර්ණ සංඛ්‍යාවෙන් අඩකට නොඅඩු ගණනක් සමිතියේ සාමාජිකයන්ගෙන් යුක්ත වන පරිදි සමිතියේ සාමාජිකයන් අතරින් තෝරාපත් කර ගත යුතුයඃ කෙසේ වුවද, ව්‍යවස්ථා මාලාවේ ෂෂ (අ) වගන්තිය පරිදි පත්කර ගනු ලබන පිටස්තර පුද්ගලයන් දෙදෙනාගෙන් එක් අයයෙකු සමිතියේ සභාපති හෝ ලේකම් වශයෙන් පත්කර ගත යුතු අතර, අනෙක් අය සමිතියේ සාමාජිකයෙකු විය යුතු.

(අ) වයස අවුරුදු 21 ට අඩු කිසිවෙකු විධ ායක මණ්ඩලයට තෝරාපත් කර ගත නොහැකිය

## 16. නිළධාරින්ගේ වගකීම

(අ) ඉල්ලා අස්වීම, නිලයෙන් පහ කිරිම යන අවස්ථා වල දී ධූරයෙන් ඉවත් වි යන සමිතියේ සෑම ලේකම්වරයෙකු විසින්ම තම භාරයේ ඇති සමිතියේ සටහන් පොත් සහ සමිතිය සතු සියළුම ලිය කියවිලි ඔහු වෙනුවට ලේකම් ධූරයට පත් වන අයට හෝ සමිතියේ සභාපතිවරයාට තමා ධූරයෙන් ඉවත් වී සතියක් ඇතුළත භාරදිය යුතුය.

(ආ) විශේෂයෙන් වෘත්තීය සමිති ආඥා පනත යටතේ පැවරෙන නීතිමය වගකීම් සියල්ල සම්පූර්ණ කිරිම සඳහා සමිතියේ ලේකම් වගකිව යුතුය. ආඥා පනතේ 50( ) හා (2) වගන්තවල සඳහන් ප්‍රතිපාදන අනුව සමිතියේ වාර්ෂික වාර්තා වාත්තිය සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත නියමිත කාලසිමාව තුළදි සැපයිය යුතුය.

(ඉ) මෙම සමිතියේ සෑම භාණ්ඩාගාරික කෙනෙකු විසින් ද එහි ගණන් හිලව් ගැන හෝ මුදල් එකතු කිරිම හෝ වියදම් කිරිම හෝ තබා ගැනීම හෝ පාලනය ගැන හෝ වගකිව යුතු වෙනත් සෑම නිලධාරියෙකු විසින් ද ඔහු ධූරයෙන් ඉල්ලා අස්වන විට දූරයෙන් අත්හරින වියට හෝ අවුරුද්දකට වරක් එම සමිතියෙහි සාමිකයන් වසින් යෝජනාවකින් ඉල්ලන පරිදි හෝ එහි ව්‍යවස්ථාවල දැක්වෙන පරිදි අන්කිසි කාලයකදී හෝ ඔහු ධූරයට පත් වූ දින සිට පසුවුණු කාලයට අතරතුර ලබන ලද සහ ගෙවන ලද මුදල් පිලිබඳව අය වැය ලේඛණයක් වෘත්තීය සමිති ආඥා පනතේ 49 වැනි වගන්තියනේ නියම කර ඇති අන්දමට වෘත්තීය සමිතියට සහ එහි සාමාජිකයන්ට ඉදිරිපත් කළ යුතුය.

**17. ගණන් පරීක්ෂක**

**18. භාරකාරවරු**

1. එස්. ආනන්දි දේවේන්ද්‍ර කුමාරි
2. මේන හා කන්දසාමි
3. රංජිත් විජේසිංහ

**19. නිලයෙන් ඉවත් කිරිම**

පත්කර ගනු ලැබුඕනෑම විධායක මාණ්ඩලිකයෙකු ගණන් පරීක්ෂකයෙකු රොහ් භාරකරුවෙකු මහ සභා රැස්වීමකදී ඊට පැමිණ සිටින සාමාජිකියන්ගෙන් යටතේ පිරිසෙයින් තුනෙන් දොොකටසකගෙන් සම්මත වූ යෝජනාවකින් මිස වෙන අන් ලෙසකින් නිලයෙන් ඉවත් කළ නොහැක්කේය. එසේ වූ නමුත් එබඳු කවර කෙනෙකු වුවද තාවකාලිකව නිලයෙන් අත්හිටුවීමට විධායක මණ්ඩලයට බලය ඇත. එසේ කළ කල්හි ගැන වැඩිදුටත් ක්‍රියා කිරීම සඳහා හෝ විදායක මණ්ඩලය ගත් පියවර ස්ථිර කිරිම සඳහා හෝ එම කරුණ මහා සභා රැස්වීමට ඉදිරිපිත් කළ යුතුය. මහා සභා රැස්වීම් දෙකක් අතරතුර කාලයේදී ඇතිවන ඇබෑර්තු විධායක මණ්ඩලය විසින් පිරවිය යුතුය.

**20. අරමුදල්**

(අ) සමතියේ අරමුදල් 3 වන අව්ථාවේ සඳහන් පරමාර්ථයන් මුදුපත් කර ගැනීම පිණිස මිස කිසිම තැනැත්තෙකුට උසාවියේ නඩු තීන්ඩුකින් හෝ ආඥාවකින් ගෙවීමට නියම වන දඩයක් ගෙවීම පිණිස කවර ආකාරයකින් හෝ යෙදිය නොහැක්කේය.

(ආ) සමිතියේ අරමුදල් පහත සඳහන්න (ඊ) අනුජේදයෙන් යටත්ව, විධායක මන්ඩලය විසින් තීරනය කරනු ලබන බැංකුවක භාරකරුවන්ගෙන් නමින් භාණ්ඩාගාරිකගේ සහ සභාපතිගේ හෝ ලේකම් ගේ අත්සන් පිට තැන්පත් කළ යුතුය. බැංකු ගිණුමක් ආරම්භ කළ වහාම බැංකුවේ නම සහ ගිණුම් අංකය වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර්වරයාට දැන්විය යුතුය.

(ඉ) භාණ්ඩාගාරිකගේ සහ සභාපතිගේ හෝ ලේකම්ගේ අත්සන් පිට සමිතියේ අරමුදල් බැංකුවෙන් අස්කර ගත හැකිය

(ඊ) කිසිම අවස්ථාවක සාමාජික මුදල් වශයෙන් හෝ වෙනත් යම්කිසි ක්‍රමයකින් හෝ ලැබෙන මුදල් වලින් රු. 5000/= කට වැඩි ප්‍රමාණයක් තා ළග තබා ගැනිමට භාණ්ඩාගාරික තැනට නොහැකිය. ඊට වැඩිවන සෑම මුදලක්ම ඔහු භාරකරුවන්ගේ නාමයෙන් වහාම බැංකුවේ තැන්පත් කළ යුතුය.

21. විසුරුවා හැරිම

සමිතියේ විසුරුවා හැරිමක්, සමිතයේන ගෙවිය යුතු සියළු නිත්‍යානුකූල වියහියදම් ගෙවිමෙන් පසු එහි අරමුදල් ගැන ක්‍රියා කිරිමත් ඒ සඳහා කැඳවන ලද විශේෂ මහා සභා රැස්විමකදී ඊට පැමිණි සිටින ඡන්ද බලය හිමි සාමාජිකයින්ගෙන් තුනෙන් දෙකොටසකට සම්මත වු යොජනාවකින් තීරනය වන පරිද්දෙන් කළ යුතුය. සමිතියේ විසුරුවා හැරිමනේ දින 14 ක් ඇතුළත ඒ බව රෙජිස්ට්‍රාර්වරයාට නියමිත ආකෘතියික්න දන්වන අතර ලියාපදිංචි කිරිමේ සහතිකය ආපසු ගෙවිය යුතුය. සමිතියේ ලියාපදිංචි කිරීමේ සහතිකය වෘත්තය සිමිති රෙජිස්ට්‍රාර් විසින් අවලංගු කෙලෙහිනම් සමිතියේ ලේකම් ඒ සම්බන්ධයනේ රැස්විමක් කැඳවා සාමජිකයන ටජ් බව දන්වා සමිතියෙන් ගෙවිය යුතු සියළුම නිතිත්‍යානුකූල වියහියදම් ගෙවිමෙනන් පසු එහි අරමුදල ගැන ක්‍රියා කර වෘත්තිය සිමිති ආඥා පනතේ 16 (1) වගන්තිය යටතේ ක්‍රියා නොකරන්නේනම්, සමිතිය් විසුරුවා හැර සමිතියේ ලියාපදිංචි කිරීමේ සහතිකය රැස්වීමෙන් දින 14 ක් ඇතුළත වෘත්තිය සමිති රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය.

ඉහත ව්‍යවස්ථා මාලාව සභා සම්මත විය

සම ලේකම්වරුන්ගේ අත්සන

2011.08. 29 වන දින දිය

සමිතියේ ලියාපදිංචි ලිපිනයට ආසන්න දුරකථන අංකයඃ 081 4481761